## බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

**(බස්නාහිර පළාත් මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන හා වෙළඳ, නිවාස සහ ඉදිකිරීම්, වතු යටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය)**

## මිහිලක් එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල සහ මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන කර්මාන්තශාලා හි සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) තනතුර සඳහා ඇබෑර්තු

බස්නාහිර පළාත් කර්මාන්ත සංවර්ධන අධිකාරිය යටතේ ක්‍රියාත්මක වල්පිට, **මිහිලක් එළවළු සහ පළතුරු වලින් අගය එකතු කල නිෂ්පාදන, මාළු සහ ඉස්සන්ගේ අගය එකතු කල නිෂ්පාදන කර්මාන්තශාලා හි සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්)** තනතුර සඳහා සුදුසුකම්ලත් පුද්ගලයින්ගෙන් කාර්ය පැවරුම් පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**සුදුසුකම්:**

අධ්‍යාපන හා පළපුරුද්ද

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ආහාර විද්‍යාව සහ තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිය (BSc. In Food Science & Technology (Special) Degree) හෝ ඊට සමාන උපාධියක් ලබා තිබීම සහ,

(ii) උපාධිය ලබා ගැනීමෙන් පසු අවුරුදු හතරක (04) ට නොඅඩු කාලයක් ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම.

(iii) ආහාර නිෂ්පාදනය හෝ තාක්ෂණ පිළිබඳ කර්මාන්තශාලා හි පළපුරුද්ද විශේෂ සුදුසුකමක් වනු ඇත.

**වයස :**

(i) වයස අවුරුදු 22ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප:**

මෙම තනතුර සඳහා වන මාසික දීමනාව සම්මුඛ පරීක්ෂණයේදී සාකච්ඡා කරගත හැක.

**සේවා කොන්දේසි:**

01. මෙම තනතුර කාර්ය පැවරුම් පදනමකින් යුතුය.

02. ඉල්ලුම්පත්‍ර කැඳවන අවසාන දිනයට ආසන්න වසර 03ක් තුල බස්නාහිර පළාතේ පදිංචිකරුවන් හෝ ගම්පහ දිස්ත්‍රික්කය හෝ ඊට ආසන්න දිස්ත්‍රික්කයක පදිංචිකරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

03. මෙම තනතුර සඳහා සේවක අර්ථ සාධක අරමුදල් සහ සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලේ දායකත්වය හිමිය.

04. බඳවාගනු ලබන අය බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ, දිවුලපිටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ, වල්පිට ග්‍රාම සේවා වසමේ පිහිටි කර්මාන්තශාලා හි සේවය සඳහා සූදානම්ව සිටිය යුතුය.

ඔබ විසින් සකස් කරන ලද ජීවදත්ත පත්‍රිකාවක් (Bio Data) සියළුම අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද සහ වයස, පදිංචි ස්ථානය පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමඟ **අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක, කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.) නො.4ඒ,1/1, සෝරත මාවත, ගංගොඩවිල, නුගේගොඩ** යන ලිපිනයට ලැබෙන සේ **2024.12.04** දිනට හෝ එදිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපැලෙන් idawp@sltnet.lk එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක**
**කර්මාන්ත සංවර්ධන අධිකාරිය (බ.ප.)**